මධ්‍යම පළාත් සභාව යටතේ පාලනය වන පාසල්වල ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරී ගුරු භවතුන් බඳවා ගැනීම 2023 (II වන අදියර)

මධ්‍යම පළාතේ පළාත් සභා පාසල්වල සිංහල හා දෙමළ මාධ්‍ය විෂයන්වල පවතින ගුරු පුරප්පාඩු සඳහා මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-1(අ) ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් පරිදි සුදුසුකම් සපුරා ඇති මධ්‍යම පළාතේ ස්ථිර පදිංචි උපාධිධාරීන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. බඳවා ගැනීමේ සාමාන්‍ය සුදුසුකම්

i. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
ii. මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ හැකි විය යුතුය.
iii. යහපත් චරිතයකින් සහ මනා මානසික හා කායික සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය.
iv. 2023.11.20 දිනට පූර්වාසන්න වසර 03 ක් මධ්‍යම පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
- මධ්‍යම පළාතේ පූර්වාසන්න වසර 03 ක හෝ ඊට වැඩි ස්ථිර පදිංචියක් ඇති අයෙකු සමඟ විවාහගිවිසුණු/විවාහ වී මධ්‍යම පළාතේ ස්ථිර පදිංචියට පැමිණි අයටද පදිංචිය සනාථ කෙරෙන ලිඛිත සාක්ෂි මත ඉල්ලුම් කළ හැක.

v. 2023.11.20 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

02. අධ්‍යාපන සුදුසුකම්

i. අංක 1885/38 හා 2014.10.23 දිනැති ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 7.2.2.1 වගන්ති සටහන පරිදි අ.පො.ස (සා.පෙ) විභාගයේදී සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව සහිතව විෂයන් හයකින් සමත්ව තිබිය යුතුය.

සහ

ii. මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව 2023.11.20 දිනට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයක් මගින් හෝ ප්‍රදානය කරනු ලැබූ උපාධියක් ලබා තිබිය යුතුය.
iii. මෙම නිවේදනයේ සඳහන් උපලේඛන අංක 01 හි ඇති විෂයන්වලට අදාළව පමණක් මෙම බඳවා ගැනීම සිදු කරන අතර, එක් එක් විෂයය සඳහා එහි සඳහන් කර ඇති සුදුසුකම් සපුරා තිබීම අනිවාර්ය වේ.

සැලකිය යුතුය :

➢ අයදුම්පත් කැඳවීමේ අවසන් දිනයට නිවේදනයේ සඳහන් සියලු සුදුසුකම් සපුරා තිබිය යුතුය.
➢ ඉහත බඳවා ගැනීමේ මූලික සුදුසුකම් හා අධ්‍යාපන සුදුසුකම් නොමැති අය ඉල්ලුම් නොකළ යුතුය.

2023.08.18 දින දිනමිණ, තිනකරන් හා ඩේලි නිවුස් පුවත්පත්වල "මධ්‍යම පළාතේ පළාත් සභා පාසල්වල පවතින අ.පො.ස(උ.පෙළ) ගණිතය, විද්‍යා, තාක්ෂණවේදය, විදේශ භාෂා හා විශේෂ අධ්‍යාපන විෂයන්වල පවතින පුරප්පාඩු සඳහා මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-1(අ) ශ්‍රේණියට බඳවා ගැනීම" උද්ධෘතයෙන් පළකරන ලද පුවත්පත් දැන්වීමට අදාළව අයදුම්පත් යොමු කළ අයදුම්කරුවන්ටද මේ සඳහා අයදුම් කළ හැකිය. එලෙස අයදුම්කරන අයදුම්කරුවන් මෙම බඳවා ගැනීම සඳහා පවත්වන තරග විභාගය සඳහාද අදාළ විභාග ගාස්තු ගෙවිය යුතු වේ.

03. සේවා කොන්දේසි

රජයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලටද, මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලටද, ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ ඇති කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතුවට කෙරෙන හෝ සංශෝධනවලටද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයින් මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-1(අ) වන ශ්‍රේණියට පත් කරනු ලැබේ.

i. උසස් කිරීම්/සේවා කොන්දේසි මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවරයා විසින් 2015.10.09 දිනැතිව අනුමත කරන ලද මධ්‍යම පළාත් ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන යටතේ සිදු කරනු ඇත.
ii. මෙම තනතුරට පත්කරනු ලබන සෑම ගුරු භවතෙක්ම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ. මූලික පත්වීම් ලබන පාසලේ වසර 05 ක සේවා කාලයක් අනිවාර්යයෙන්ම සේවය කළ යුතුය. වසර 05 අවසානයේ දී ස්ථාන මාරු ඉල්ලීමට සුදුසුකම් ලබනු ඇත.
iii. මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට පත්වීම්ලාභීන් යටත් විය යුතුය.
iv. 2020.10.16 දිනැති රාජ්‍ය 15/2020 අනුව දෙවෙනි රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.
v. වැටුප් පරිමාණය

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016 අනුව මෙම පත්වීමට හිමි වැටුප් ක්‍රමය අංක ජී-3-1-2016 දරන වැටුප් කාණ්ඩයේ රු.31,490 - 445X6 - 525x7 - 660x21 - රු.39,035/- ක් වූ වැටුප් පරිමාණයේ 14 වන පියවරේහි වැටුප වන රු.37,835/- මත පිහිටුවනු ලැබේ.

04. අයදුම් කිරීමේ ක්‍රමය

i. සියලුම අයදුම්කරුවන් http://cm.cp.gov.lk යන මෙම අමාත්‍යංශ නිල වෙබ් අඩවියට පිවිස "මධ්‍යම පළාත් සභාව යටතේ පාලනය වන පාසල්වල ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරී ගුරු භවතුන් බඳවා ගැනීම 2023 (II වන අදියර)" උද්ධෘතය යටතේ ඇති වෙබ් සබැඳියට පිවිස මාර්ගගත අයදුම්පත්‍රයට තොරතුරු ඇතුළත් කිරීමෙන් පසුව අයදුම්පත්‍රය බාගත කළ හැක.
ii. මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම් කරන අයදුම්කරුවන්ගේ අයදුම්පත්‍ර හැර පරිගණකය මගින් සකස් කරන ලද හෝ අතින් ලියා සකස් කරන ලද කිසිදු අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ.
iii. බාගත කරන ලද අයදුම්පත්‍රය රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු හෝ රු.41,380/- ට වැඩි මාසික ආරම්භක මූලික වැටුපක් හෝ ඊට වැඩි වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික නිලධාරියකු විසින් අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන සහතික කරනු ලැබ තිබිය යුතුය.
iv. නිවැරදිව සම්පූර්ණ කර බාගත කරන ලද අයදුම්පත්‍රය 2023.11.20 දිනට හෝ ඊට පෙර "ලේකම්, මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය, පළාත් සභා සංකීර්ණය, පල්ලේකැලේ" යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "මධ්‍යම පළාත් සභාව යටතේ පාලනය වන පාසල්වල ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරී ගුරු භවතුන් බඳවා ගැනීම 2023 (II වන අදියර)" යනුවෙන් සඳහන් කර ඊට යටින් බාගත කරන ලද මාර්ගගත අයදුම්පත්‍රයේ යොමු අංකය (Reference Number) සඳහන් කළ යුතුය.
v. එක් අපේක්ෂකයෙකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි. අයදුම්කරුවෙකුට එක් විෂයයක් සඳහා පමණක් ඉල්ලුම් කළ හැකි අතර, අයදුම් කරනු ලබන විෂයය කිසිසේත් වෙනස් කරනු නොලබන අතර, ඒ පිළිබඳ ඉදිරිපත් කරන අභියාචනා පිළිබඳව සලකා බලනු නොලැබේ.
vi. සෑම අංශයකින්ම සම්පූර්ණ නොවන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. මාර්ගගත අයදුම් කිරීමේදී PART II කොටස සම්පූර්ණ නොකළ අයදුම්පත්‍ර භාරගනු නොලැබේ.
vii. අයදුම්පත් ලැබී ඇති බව දන්වනු නොලැබේ. නමුත් අදාළ මාර්ගගත පද්ධතියෙහි ඔබ විසින් නිවැරදිව අයදුම්පත ඉදිරිපත් කළ පසු (Submit කළ පසු) මාර්ගගත පද්ධතිය මගින් තහවුරුවක් ලබාදෙනු ඇත.
viii. විභාගය සඳහා අයදුම්කරුවන් වෙත විද්‍යුත් තැපැල (E-mail) මඟින් හෝ කෙටි පණිවුඩයක් (SMS) මුළින් ප්‍රවේශ පත්‍ර නිකුත් කළ විගස ඒ බව සඳහන් කරමින් http://cm.cp.gov.lk වෙබ් අඩවියේ හෝ පුවත්පත් නිවේදනයක් පළකරනු ලැබේ. එම පුවත්පත් නිවේදනය පළවී දින 3 ක් ගතවූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් විමසීම් කළ හැකිය.
ix. දැනට රජයේ සේවයේ නියුතු නිලධාරීන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් සහතික කරන ලද අයදුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ.

රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් ද අනෙකුත් අයදුම්කරුවන්ද තම අයදුම් පත්‍රය අනිවාර්යයෙන්ම අයදුම්පත්‍ර භාර ගන්නා අවසන් දිනට හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතු අතර, අවසන් දිනට පසුව යොමු කරන කිසිදු අයදුම්පත්‍රයක් හෝ අභියාචනයක් පිළිබඳව සලකා බලනු නොලැබේ.

05. බඳවා ගැනීමේ ක්‍රමවේදය

i. 2015.10.19 දිනැති මධ්‍යම පළාත් ගුරු සේවා ව්‍යවස්ථාව අනුව පවත්වනු ලබන ලිඛිත තරග විභාගයෙන් සමත් අපේක්ෂකයින් අතුරින් ඉහළම ලකුණු ලබා ගන්නා අනුපිළිවෙළ අනුව ඒ ඒ විෂයයට අදාළ උපලේඛන 01 හි සඳහන් ගුරු පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන් ගුණයක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා නියමිත දිනයේදී සහභාගී නොවන අයදුම්කරුවන් පිළිබඳව පසුව කිසිදු අයුරකින් නැවත සලකා බලනු නොලැබේ.

ලිඛිත තරග විභාගයෙන් සමත්ව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අයදුම්කරුවන් වෙත ඒ සඳහා ඉදිරිපත් කළ යුතු ලේඛන පිළිබඳව එම සම්මුඛ පරීක්ෂණයට පෙර විද්‍යුත් පණිවුඩයකින් සහ ලිපියකින් දැනුම්වත් කිරීමට කටයුතු කරනු ලැබේ.

ii. එසේම සම්මුඛ පරීක්ෂණ දිනයට පසුව ඉදිරිපත් කරනු ලබන කිසිදු සහතිකයක් භාරගනු නොලබන අතර, ඉල්ලා සිටිනු ලබන සියලුම ලිපි ලේඛන සමඟ සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීම අනිවාර්ය වේ.
iii. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.
iv. සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන් පසුව ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවනු ලැබේ. ප්‍රායෝගික පරීක්ෂණය ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ "ආ" පරිශිෂ්ටයේ උපදෙස් අනුව පවත්වනු ලැබේ.
v. සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අපේක්ෂකයන් ප්‍රායෝගික පරීක්ෂණය සඳහා අනිවාර්යයෙන් ඉදිරිපත් විය යුතු අතර, ලිඛිත විභාගයේ සහ ප්‍රායෝගික පරීක්ෂණයේ ලකුණුවල එකතුවේ ප්‍රමුඛතාව අනුව එක් එක් විෂය සඳහා පවතින පුරප්පාඩු ප්‍රමාණය මත අදාළ තනතුරුවලට බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

06. ලිඛිත තරග විභාග පටිපාටිය.

i. අයදුම්පත් ඉදිරිපත් කරන ලද සුදුසුකම් සහිත සියලුම අයදුම්කරුවන් වෙත විභාගයට ඉදිරිපත් වීම සඳහා ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයකු විභාග මධ්‍යස්ථානයේ භාරනිලධාරී වෙත තම අත්සන සහතික කරන ලද ප්‍රවේශපත්‍රය ඉදිරිපත් කළ යුතුය. එසේ ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

සැලකිය යුතුයි : අපේක්ෂකයකුට විභාග ප්‍රවේශපත්‍රයක් නිකුත් කළ පමණින් හෝ සම්මුඛ පරීක්ෂණයට හෝ ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවීම හෝ විභාගයට ඉදිරිපත් වීම මගින් හෝ ඇයට පත්වීමක් ප්‍රදානය කිරීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

07. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව

සෑම විභාග අපේක්ෂකයෙකුම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන අයුරින් විභාග ශාලාවේදී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත අනන්‍යතා සහතිකයක් පමණක් පිළිගනු ඇත.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය
iii. වලංගු රියදුරු බලපත්‍රය

08. විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය

මෙම විභාගය "සිංහල" සහ "දෙමළ" මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. එහිදී සිංහල මාධ්‍යයෙන් ගුරු පුරප්පාඩු සඳහා ඉල්ලුම් කරන්නන් සිංහල මාධ්‍යයෙන් ද, දෙමළ මාධ්‍යයෙන් ගුරු පුරප්පාඩු සඳහා ඉල්ලුම් කරන්නන් දෙමළ මාධ්‍යයෙන් ද ඉදිරිපත් විය යුතුය.

සියලු අපේක්ෂකයන් මෙම සියලුම ප්‍රශ්න පත්‍ර වලට පෙනී සිටිය යුත්තේ එක් භාෂා මාධ්‍යයකින් පමණි. එම භාෂා මාධ්‍යය පත්වීම් ලබාදෙන භාෂා මාධ්‍යය වේ.

අයදුම්කරුවෙකු ඉදිරිපත් කරනු ලබන අයදුම්පතෙහි දක්වන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අවස්ථාව ලබා දෙනු නොලැබේ.

09. විෂය නිර්දේශය

මෙම විභාගයට නියමිත ප්‍රශ්න පත්‍ර සංඛ්‍යාව දෙකකි. එම ප්‍රශ්න පත්‍ර දෙකම පහත සඳහන් පරිදි බහුවරණ හා කෙටි පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්නවලින් සමන්විත වේ. සියලුම අයදුම්කරුවන් මෙම ප්‍රශ්න පත්‍ර දෙක සඳහා පෙනී සිටීම අනිවාර්යය වේ. ලිඛිත විභාගය සමත්වීමට එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා අවම වශයෙන් ලකුණු 40 බැගින් ලබාගෙන විෂයයන් දෙකම සමත්විය යුතුය.

i. අභියෝග්‍යතාව - කාලය පැය 01 යි - ලකුණු 100

අපේක්ෂකයා සතු ගුරු වෘත්තිය සඳහා වන කුසලතා සහ තාර්කානුකූල බුද්ධිය පිළිබඳ දැනුම මැන බැලීම අරමුණු කොට ගෙන සකස් වූවකි. මෙය බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විතය. එම ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

ii. සාමාන්‍ය දැනීම - කාලය පැය 01 යි - ලකුණු 100

ගුරු ක්ෂේත්‍රයට අදාළව එම ක්ෂේත්‍රය පිළිබඳව ඇති සාමාන්‍ය දැනුම හා / හෝ දේශීය වශයෙන් සිදුවී ඇති හා සිදුවන අධ්‍යාපන ප්‍රවණතා පිළිබඳ සාමාන්‍ය දැනුම හා අධ්‍යාපන පරිකරණය පිළිබඳ සාමාන්‍ය දැනුම පරීක්ෂා කෙරෙන බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50කින් සමන්විතය. එම ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

10. ප්‍රායෝගික පරීක්ෂණය

අයදුම්කරු අයදුම් කරන ලද විෂයයට අදාළව අංක 1885/38 හා 2014.10.23 දිනැති ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ "ආ" පරිශිෂ්ටය අනුව සඳහන් උපදෙස් පරිදි අයදුම්කරුවන් විසින් තදානන්තරව ලද මාතෘකාවක් යටතේ ඉදිරිපත් කිරීමක් කළ යුතුය. ඒ සඳහා පහත පරිදි ලකුණු ලබා දෙනු ලැබේ.

අනු අංකය	ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලකුණු ලබාදෙනු ලබන නිර්ණායක	උපරිම ලකුණු ප්‍රමාණය	සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය
1	ආරම්භය හා ප්‍රවිෂ්ට වීම	05	02
2	පෞරුෂය හා පන්ති පාලනය	05	02
3	සන්නිවේදනයේ පැහැදිලි බව	05	02
4	කාල කළමනාකරණය	05	02
5	ඉදිරිපත් කිරීමේ ශිල්පක්‍රම භාවිතය	05	02
	මුළු ලකුණු ප්‍රමාණය	25	10

ප්‍රායෝගික පරීක්ෂණ ක්‍රමවේදය

i. ප්‍රායෝගික පරීක්ෂණය සඳහා කාලය විනාඩි 5 කට නොඅඩු කාලයක් ලබා දෙනු ලැබේ.
ii. ප්‍රායෝගික පරීක්ෂණය ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය විසි පහකි.
iii. ප්‍රායෝගික පරීක්ෂණය සමත් වීම සඳහා එක් එක් නිර්ණායක සඳහා අවම වශයෙන් ලකුණු 2 බැගින් ලබා ගත යුතුය.
iv. ප්‍රායෝගික පරීක්ෂණයේ ඇගයීම මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබේ.

නිර්ණායකයන්හි අරමුණ

i. ආරම්භය හා ප්‍රවිෂ්ට වීම

සාර්ථකව පාඩමේ අරමුණ පැහැදිලි කිරීම හා පාඩමට ප්‍රවිෂ්ට වීමේ හැකියාව ඇගයීම.

ii. පෞරුෂය හා පන්ති පාලනය

ගුරුවරයෙකු ලෙස මනා පෞරුෂයකින් යුතු වීම හා ඉගැන්වීමේ දී මනා ලෙස පන්ති පාලනය කිරීමේ ඇති හැකියාව ඇගයීම.

iii. සන්නිවේදනයේ පැහැදිලි බව

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී අදාළ කරුණු ඵලදායී ලෙස සන්නිවේදනය කිරීමේ හැකියාව ඇගයීම.

iv. කාල කළමනාකරණය

ලබා දෙනු ලබන කාල සීමාව තුළ අරමුණ කෙරෙහි ළඟා වීමේ කුසලතාවය ඇගයීම

v. ඉදිරිපත් කිරීමේ ශිල්පක්‍රම භාවිතය

අරමුණ කෙරෙහි ළඟා වීම සඳහා ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම මනා ලෙස භාවිතා කිරීමේ හැකියාව ඇගයීම.

11. විභාග හා පරිපාලන ගාස්තු

විභාග ගාස්තු රු.600/- කි. මෙම විභාග ගාස්තුව ආදායම් ශීර්ෂ අංක 2002-02-13 ට මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන ලේකම් නමින් මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදල් ගෙවා ලබාගන්නා තීරුවක ලදුපත අයදුම්පත්‍රයේ නියමිත තීරුවේ අලවා එම ලදුපත් අංකය සඳහන් කර එවිය යුතුය.

ඉහත සඳහන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට හැර වෙනත් ආයතනවල මුදල් ගෙවා ලබාගත් කුවිතාන්සි හා මුදල් ඇණවුම් හෝ මුදල් නිකුවක් භාර ගනු නොලැබේ. උපදෙස් පරිදි අදාළ ගෙවීම සිදුකර නොමැති අයදුම්කරුවන්ට විභාගය සඳහා ඉදිරිපත් වීමට අවස්ථාව ලබා දෙනු නොලැබේ. කිසිදු හේතුවක් මත ගෙවූ විභාග ගාස්තු නැවත ගෙවීමක් සිදු කරනු නොලැබේ.

11. විභාගය සියලුම දිස්ත්‍රික්කයන්හි පැවැත්වෙන්නේද නැතහොත් කවර දිස්ත්‍රික්කයන්හි පැවැත්වෙන්නේද යන්න විභාග අපේක්ෂකයින් සංඛ්‍යාව මත මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් තීරණය කරනු ඇත.
12. පත්වීම් ක්‍රියාත්මක වන දින සිට දින 14 ක් ඇතුළත සේවයට වාර්තා කළ යුතුය. පත්වීම් ලැබූ පාසල වෙනස් කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.
13. අයදුම්පත් භාරගන්නා අවසන් දින සිට ඉදිරි වසරක කාල සීමාවක් තුළ බඳවා ගැනීම සඳහා පමණක් මෙම පුවත්පත් දැන්වීම වලංගු වේ.
14. මෙම නිවේදනයෙන් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතියද කිසියම් පුරප්පාඩු වලින් කොටසක් හෝ මුළුමනින්ම පිරවීම හෝ නොපිරවීම හෝ පිළිබඳව අවසන් තීරණය ගැනීමේ අයිතිය ද මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයා සතුය.
15. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් පළ කරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම් එවැනි විටක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

එච්.එම්.එම්.ශු.බී. හේරත්,
ලේකම්,
මධ්‍යම පළාත් ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය,

2023 ඔක්තෝබර් මස 26 වන දිනදීය.
ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය,
මධ්‍යම පළාත.

විෂය කේත අංකය	විෂයය	සුදුසුකම්	මාධ්‍යම: සිංහල මාධ්‍යය	මාධ්‍යම: දෙමළ මාධ්‍ය	එකතුව
1	ගණිතය	ශුද්ධ ගණිතය / ව්‍යවහාරික ගණිතය / සංයුක්ත ගණිතය ප්‍රධාන විෂයය ලෙස හදාරා ඇති සාමාන්‍ය හෝ විශේෂ උපාධියක්	50	25	75
2	ඉංග්‍රීසි (සාහිත්‍ය)	ඉංග්‍රීසි පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධියක් හෝ ඉංග්‍රීසි භාෂාව ප්‍රධාන විෂයක් වන ඕනෑම ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා තිබීම.	10	10	20
3	ඉතිහාසය	ඉතිහාසය පිළිබඳ ශාස්ත්‍ර වේදී (විශේෂ) උපාධියක් හෝ ඉතිහාසය ප්‍රධාන විෂයක් වන ඕනෑම ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා තිබීම.	30	3	33
4	භූගෝල විද්‍යාව	භූගෝල විද්‍යාව පිළිබඳ ශාස්ත්‍ර වේදී (විශේෂ) උපාධියක් හෝ භූගෝල විද්‍යාව ප්‍රධාන විෂයක් වන ඕනෑම ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා තිබීම.	15	9	24
5	පුරවැසි අධ්‍යාපනය	දේශපාලන විද්‍යාව ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක් හෝ ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධියක් දේශපාලන විද්‍යාව විෂය ඇතුළුව ලබා තිබීම.	13	5	18
6	ව්‍යාපාර අධ්‍යයනය හා ගිණුම්කරණය	වාණිජ විෂයයට අදාළ ඕනෑම උපාධියක් ලබා තිබීම.	20	12	32
7	චිත්‍ර කලාව	චිත්‍ර කලා / මූර්ති විෂය සහ අදාළ විෂය පිළිබඳ දෘශ්‍ය කලාවේදී (විශේෂ) උපාධිය හෝ චිත්‍ර කලා/මූර්ති විෂය සහ අදාළ විෂය පිළිබඳ ලලිත කලාවේදී (විශේෂ) උපාධිය හෝ අදාළ විෂය යටතේ ලබා ඇති ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත පිළිගත් විදේශීය විශ්වවිද්‍යාලයකින් අදාළ විෂයය සඳහා ලබා ඇති උපාධියක් හෝ අදාළ සාමාන්‍ය උපාධියේ මුළු විෂයය සන්ධාරයෙන් 1/3 ක් චිත්‍ර විෂයය සහිතව හා අ.පො.ස. (උසස් පෙළ) චිත්‍ර කලා විෂයය සඳහා A හෝ B සාමාර්ථයක් ලබා තිබීම.	15	8	23
8	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය	තොරතුරු සන්නිවේදන තාක්ෂණ (විශේෂ) උපාධියක් ලබා තිබීම. හෝ උපාධියෙහි මුළු විෂය සන්ධාරයෙන් 1/3 ක් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය අන්තර්ගත වන පරිදි හදාරා ඇති විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම.	23	25	48
9	ප්‍රාථමික	සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ සිංහල / දෙමළ භාෂාව හෝ සිංහල / දෙමළ වත් විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති ශාස්ත්‍ර වේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් ලබා තිබීම.	54	51	105